# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1961/6 - 2016 අප්‍රේල් මස 05 වැනි අඟහරුවාදා - 2016.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමග කියවිය යුතු 25 වැනි වගන්තියෙන් ගරු මුදල් අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2015.12.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවන ලද අංක 1945/8 දරන 2015.12.15 දිනැති ගැසට් නිවේදනයෙහි සඳහන් වූ පහත දැක්වෙන නියමය 2016.03.10 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

නියමය

(1) වෙනත් කිසිම නිවේදනයක මීට පටහැනිව කවරක් සඳහන් කර තිබුන ද, ඒ බව නොසලකා බලපත්‍රලත් නිෂ්පාදනාගාරයකින් නිකුත් කරනු ලබන හෝ ඕනෑම බලපත්‍ර ස්ථානයක සිල්ලර විකිණීම සඳහා ඇති විශේෂ අරක්කු, තල් අරක්කු, ඉක්ෂුපාක අරක්කු, පොල් අරක්කු සහ පදම් කළ අරක්කුවල සැර ප්‍රමාණය ඒ ඒ නිෂ්පාදන සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන සැර ප්‍රමාණයක්ම විය යුතු අතර නිෂ්පාදකයා විසින් ලේබලයේ දක්වා ඇති අනුමත නිරපේක්ෂක සැර 20.0%ට නොඅඩු විය යුතු අතර නිරපේක්ෂක සැර 48.5%ට නොවැඩි විය යුතු බව,

(2) දේශීයව නිෂ්පාදනය කරනු ලබන ''විදේශීය '' මත්පැන් හෝ ආනයනික ''විදේශීය'' මත්පැන් සඳහා අවම නිරපේක්ෂක සැර ප්‍රමාණය 37.0%ක් විය යුතු අතර උපරිම නිරපේක්ෂක සැර ප්‍රමාණය 50.0%ක් විය යුතු බව,

(3) කිරිපොන්සා සඳහා උපරිම නිරපේක්ෂක සැර ප්‍රමාණය 17.1%ක් විය යුතු බව,

(4) වෛද්‍ය වයින් වර්ග සඳහා උපරිම නිරපේක්ෂක සැර ප්‍රමාණය 20.0%ක් විය යුතු බව,

(5) දේශීයව නිෂ්පාදනය කරනු ලබන ධාන්‍ය මත්පැන් හෝ ආනයනික ධාන්‍ය මත්පැන් සඳහා අවම නිරපේක්ෂක සැර ප්‍රමාණය 4.0%ක් විය යුතු අතර උපරිම නිරපේක්ෂක සැර ප්‍රමාණය 8.8%ක් විය යුතුය.

1928 ජුනි 01 දිනැති 176 දරන සුරාබදු නිවේදනයේ III කොටසේ (14) වැනි වගන්තිය, 1985.08.13 දිනැති අංක 743 දරන සුරාබදු නිවේදනය සහ 1985.12.16 දිනැති අංක 749 දරන සුරාබදු නිවේදනය මෙයින් පරිච්ඡින්න කරමි.

04 - 804


1A - PG 2915 — 106 (2016/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*